# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2174/4 - 2020 මැයි මස 06 වැනි බදාදා - 2020.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 12/1978 (III)

**ශ්‍රේෂ්ඨාධිකරණ රීති**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ අගවිනිසුරුවරයා විසින් සහ එම ව්‍යවස්ථාව යටතේ ඔහු විසින් නම් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිසුරුවරුන් විසින් සාදනු ලබන රීති.

1. අගවිනිසුරු ජයන්ත ජයසූරිය
2. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බී. පී. අලුවිහාරේ
3. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ. එස්. ජේ. ද ආබෘෘ
4. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු පී. ජයවර්ධන

2020 මැයි මස 06 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මේ රීති 2020 ශ්‍රේෂ්ඨාධිකරණ (තාවකාලික විධිවිධාන) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1991 ජුනි මස 07 වන දින අංක 665/32 දරන *අති විශෙෂ* ගැසට් පත්‍රයේ පළ කරන ලද 1990 ශ්‍රේෂ්ඨාධිකරණ රීතිවල 7 වන රීතියේ පටහැනිව කුමක් සඳහන් වුවද, එය නොතකා, 7 වන රීතියේ සඳහන් සති හයක කාලසීමාව ගණනය කිරීමේදී 2020 මාර්තු මස 16 වන දින සිට ආරම්භව 2020 මැයි මස 18 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සැලකිල්ලට ගනු නොලැබිය යුතු ය.

ජයන්ත ජයසූරිය,
අගවිනිසුරු.

බී. පී. අලුවිහාරේ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු.

කේ. එස්. ජේ. ද ආබෘෘ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු.

පී. ජයවර්ධන,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු.


1A - G 32232— 27 (2020/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*